
# The Sacred Tooth Relic in Dalada Maligawa



*King Kithsiri Mevan received the Tooth Relic and venerated it.*
කිත්සිරි මෙවන් රජතුමා දන්තධාතූන් වහන්සේට ඉමහත්වූ ගෞරව දැක්විය





**Kandy with its salubrious climes and the fascinating scenery is a beautiful city, unique and unmatched.**

It was the capital of the Singhalese Kings from 1592 to 1815 when they reigned supreme, fortified by the terrain of the mountains and the difficult approach. The Temple of the Sacred Tooth Relic, popularly known as the **Sri Dalda Maligawa** is located in this beautiful city and was built within the royal palace complex itself which housed the Buddha's only surviving Tooth Relic, the hallowed object of veneration for the Buddhists the world over. It is needless to speak much about this city, but suffice to mention that it is a world heritage site declared by **UNESCO.**

This Sacred Relic has a long and unbroken history spanning over two and half millennia. When Buddha passed away, His body was cremated in a sandal wood pyre at Kusinara in India and His left canine tooth was retrieved from the funeral pyre by Arahat Khema who handed it over to King Brahmadatte for veneration.

Ever since then it became a royal possession and there grew up a belief that whoever who possessed the Sacred Tooth Relic had a divine right to rule the country. Thus there were wars to take possession of the Relic and finally when it was in the possession of King Guhasiva of Kalinga, fearing that his enemies would snatch it, he secretly sent the Sacred Tooth Relic to Sri Lanka through his daughter Princess Hemamali and her husband Danthakumara. Hemamali hid the sacred tooth within the coiffure to avoid the attention of passersby.

The ruler of Sri Lanka at the time was King Kithsirimevan. The king received Buddha's Relic with great respect and highest reverence and the tradition has continued through out centuries to the present day.

## නුවර ඇසළ පෙරහැර සිරි මෙසේය!

ඇසළ හඳේ සුදු සඳරැස් නුවර වැව පුරා පාවී
දළදා පෙරහැර ළඟ එන බව පවසනවා
තම්මැට තාලා බෙරපද හේවිසි හොරණෑ නෙක් නද
චට පට ඩොං වෙඩි පුපුරණ සද්දෙ ඇහෙනවා
කසකාරයෝ පෙරමුණේය කැරකෙන ගිනි වළලු රාසි
තරහෙට රවුමට කැරකී මඟ එළි වෙනවා
උඩරට නැට්ටුවෝ අබරණ කන කර හිස අත සරසා
ගෙජ්ජි නාද පතුරවමින් රංචු හැදෙනවා

පිණුම් ගසන තාලෙට යන බෙර පදයට පාද තබන
නැටුම් ශිල්ප දුටු මනතින් හද කැළඹෙනවා
ලීකෙළි පන්තේරු නැටුම් කළගෙඩි මල් මාල නැටුම්
එකිනෙක පරදවන ලෙසින් පෙරට ඇදෙනවා
නැටුම් ගැයුම් වැයුම් මැද්දෙ බොරැකකුලෙන් උඩයන අය
ඔන්න වැටෙයි කියා හිතෙන රැඟුම් පානවා
හොඬවැල කන ඇඟපුරාම දිලිසෙන නන් පැහැති ඇඳුම
පොරවාගත් ඇත් රජවරු තාලෙට එනවා

රන් මිණිමුතු දිලිසෙන සේ රන්වන් සළු පිළි දිලිසේ
මාලිගාවෙ ඇතුගේ තේජස පෙන්වනවා
දළදා කරඬුව පිටමත තබා තේජසින් පිරී හිත
ගරු සරු ඇති තාලයකට ඇතුන් වඩිනවා
නිළමෙ ඇඳුම් ඇඟලාගත් නිලමෙවරුන් ගම්බිර ලෙස
දළදා කරඬුව රැකගෙන දෙපසින් යනවා
සැදැහැවතුන් එක් රොක් වී බොදුබැති හදවත් සනසන
දළදා පෙරහැර බලමින් සාදු කියනවා

♦ ***ප්‍රේමා සුරවීර රූපසිංහ***
නුගේගොඩ **Sri Lanka**

## හෙළබිම සුරකින මහනුවර දන්තධාතූන් වහන්සේ

**ක**න්ද උඩරට මහනුවර වනාහි එහි සනීපදායක දේශගුණයත්, චිත්තාකර්ෂණීය පාරිසරික සොබා සෞන්දර්යයත් නිසාම සැබැවින්ම අද්විතීය සුන්දර නගරයකි. එය බොහෝ කාලයක් සිංහළ රජවරුන්ගේ රාජධානිය වීය. කඳු, ගිරි දුර්ග ආදියෙන් යුක්තව සතුරන්ට ලෙහෙසියෙන් ළඟා විය නොහැකි පරිදි පිහිටා තිබීම මේ නගරයේ විශේෂත්වයකි. ශ්‍රී ලංකාවේ පමණක් නොව දේශ දේශාන්තරයන්හි ගෞරවයට පාත්‍රව සිටින දන්තධාතූන් වහන්සේ වැඩහිඳින ශ්‍රී දළදා මාළිගාව පිහිටා ඇත්තේ මේ කියන මනරම් මහනුවර මධ්‍යයේය. මෙම දළදා මාළිගාව ලෝක උරුමයක් ලෙස දැන් යුනෙස්කෝ ආයතනය මගින් නම්කිරීම ම එහි වැදගත්කම ඔප්පු වන්නකි.

වසර දෙදහස් පන්සීයක අඛණ්ඩ ඉතිහාසයක් මෙම දන්ත ධාතූන්වහන්සේට ඇත. බුද්ධ පරිනිර්වාණයේදී ආදාහනය කළ බුද්ධ ශරීරයෙන් ඉතිරිවූ ධාතූන් අතර මෙම දන්ත ධාතුව ඛේමා රහත් තෙරණිය විසින් බඹදත් රජුට වන්දමාන පිණිස දුන් මොහොතේ පටන් ධාතූන් වහන්සේ රජවරුන්ගේ භාරයේ පවතින්නට හේතුවිය. එසේම එය කිසියම් පාලකයෙකු භාරයේ වීනම් ඔහු රට පාලනයට සුදුස්සාය යන මතය ද මුල් බැසගත්තේය.

මෙම දන්තධාතූන් හෙවත් දළදා වහන්සේ එසේ එක් කලෙක ඉන්දියාවේ කළිඟුරට ගුහාසිව නම් රජකෙනෙකුගේ භාරයේ පැවතුණි. එම රාජධානියට සතුරු ආක්‍රමණයක් ඇති විය. දළදාවහන්සේ සතුරන් අතට පත්වේයයි සිතූ ගුහාසිව රජු කළේ එය තම දියණිය වන හේමමාලි කුමරිය හා ඇයගේ හිමියා වන දන්ත කුමරුවන්ට දී ධාතූන් වහන්සේද රැගෙන සිංහළ දේශයට ගොස් එහි රජතුමාට භාරදෙන ලෙස කීය. හේමමාලී කුමරිය කිසිවෙකුට සැක නොසිතෙන පරිදි දන්ත ධාතූන් වහන්සේ බහාලූ මංජුසාව තම විශාල කොණ්ඩයේ සවාභත්තාය. දෙදෙන ඉන්පසු බමුණෙකු හා බැමිණියක ලෙස වෙස්වලාගෙන තාම්‍රලිප්ත නම් තොටින් නැව් නැග ලංකාපටුන නම් ස්ථානයෙන් ශ්‍රීලංකා දේශයට පිවිසුනාහ.

එවකට ශ්‍රීලංකාව පාලනය කළේ කිත්සිරිමෙවන් රජතුමාය. එතුමා ඉතා සතුටින් හේමමාලාව සහ දන්තකුමරුන් පිළිගෙන ඉතා භක්තියෙන් දන්තධාතූන් වහන්සේ භාරගෙන එය විශේෂ මණ්ඩපයක වඩා හිඳුවා පුද සත්කාර කිරීම ආරම්භ කළේය. ශ්‍රීලංකාවාසීහු ද එවක් පටන් විශේෂ භක්ත්‍යාදරයකින් දන්ත ධාතූන් වහන්සේට නමස්කාර ගෞරව දක්වන්නට පුරුදුවූහ.


Duke's Court Travel

Return Fares to Colombo

SriLankan From £572 + Tax
Emirates From £826 + Tax
Qatar Airways From £326 + Tax
Etihad Airways From £404 + Tax
Kuwait Airways From £355 + Tax

For more information and reservation please call Anuradha, Sadeesh or Ned on
020 8748 3535
Duke's Court Travel
ATOL AITO IATA
*Subject to conditions
204 KING STREET LONDON W6 ORA
We give you more than just a hand



ඔබගේ නෑදෑ හිතමිතුරන්ට පහසුව, සුරක්ෂිතව
මුදල් යැවීම සඳහා එකම විශ්වාසවන්ත නාමය



MCG FAST CASH
SEND TODAY - COLLECT TODAY

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව,
දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව
හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

Transfer Fees From only £5

COMMERCIAL BANK BOC BANK OF CEYLON HNB සම්පත් බැංකුව SampathBank HSBC NSB NDB bank PEOPLE'S BANK

020 8886 4488
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT

Strong. Safe. Reliable. MCG Mike Cooke Group
දින 7ම විවෘතයි